ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2016 පරීක්ෂණය (2014 පුනර්) - 2017 පෙබරවාරි/මාර්තු

First Examination in Arts (External) 2016 (Repeat 2014) – February/March 2017

# පාප්‍ර 1.2 - ව්‍යාකරණ, ගද්‍ය රචනය හා අනිර්දිෂ්ට ග්‍රන්ථ

# PA 1.2 - Pali Grammar, Prose Composition & Unspecified Texts

කාලය පැය තුන යි

**පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටත් දෙවැනි කොටසින් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න**

---

## I කොටස

01. පහත සඳහන් ගද්‍ය ඡේදය සිංහලට නගන්න.

[illegible]. භගවති ධරමානෙ ලඞ්කායං නාගදීපෙ චූළොදරො, මහොදරොති ද්වෙ මාතුලභාගිනෙය්‍යා මණිපල්ලඞ්කස්ස කාරණා මහා සඞ්ගාමං පච්චුපට්ඨාපෙසුං. තද කිර භගවා බොධිතො පඤ්චමෙ වස්සෙ ජෙතවනෙ විහරන්තො, පච්චූසසමයෙ ලොකං ඔලොකෙන්තො තෙ දිස්වා අජ්ජ මයා තත්ථ ගන්ත්වා කලහං වූපසමෙතුං වට්ටතීති චින්තෙත්වා ඔලොකෙන්තො සමිද්ධිසුමනං නාම දෙවරාජං අද්දස. කොපනායං දෙවරාජා'ති. සො කිර අනන්තරෙ අත්ත භාවෙ නාගදීපෙ අඤ්ඤතරො මනුස්සො අහොසි. තද ගන්ධමාදනෙ වසන්තො එකො පච්චෙකබුද්ධො පිණ්ඩාය චරිත්වා, තස්මිං රාජායතනස්ස සීතච්ඡායායෙ නිසීදිත්වා හත්තකිච්චං කරොති. සො තං දිස්වා තස්මිං ඛණෙ චිත්තං පසාදෙත්වා පත්තධොවනසාඛං ආහරිත්වා අදසි. සො තෙන පුඤ්ඤකම්මෙන තතො චුතො දෙවලොකෙ නිබ්බත්තිත්වා අම්හාකං භගවතො කාලෙ ජෙතවන ද්වාරකොට්ඨක පස්සෙ රාජායතන රුක්ඛෙ දෙවතා හුත්වා නිබ්බත්ති. භගවා තං දෙවරාජං ආමන්තෙත්වා, මයා සද්ධිං නාගදීපං එහී'ති ආහ. අථානෙන අත්තනො භවනභූතං රාජායතනං මූලා උද්ධරිත්වා භගවතො මත්ථකෙ ඡත්තං විය ධාරයමානෙන, භගවා නාගදීපමගමාසි'ති.

ලකුණු 20 යි

02. පහත සඳහන් පද්‍ය පංතිය සිංහලට නගන්න.

සධාතුකං ථූපවරං යො භෙදමුපනෙති සො,
සිරිනාගොව වෙ හොති භාගී දුක්ඛස්ස කෙවලං.

හත්ථපාදදිසම්භෙදං ජිනබිම්බස්ස යො කරෙ,
සො'පි තාදිසකො හුත්වා අපායෙසූපපජ්ජති.

ඡෙජ්ජ භෙජ්ජාදිකං කත්වා යො ච බොධිමහීරුහං,
පච්චක්ඛෙපි විනාසා සො යාති පෙච්චාපි රොරාවං.

ගණං යො තීහි ද්වාරෙහි නරො'ධ අපරජ්ඣති,
සො භවෙ චතුරොපායෙ දුක්ඛභාගී භවිස්සති.

යො නරො'ධ විනාසෙති සම්බුද්ධාගමපොත්ථකං,
ජින්නභින්නො'පි සො හොති නිරයඤ්ච නිගච්ඡති.

මහානත්ථකරං පාපං ඉති විඤ්ඤාය පණ්ඩිතො,
දූරතො පරිවජ්ජෙය්‍ය මග්ගං පටිභයං යථා.

පූජෙන්තෙවං කතසුචරිතං සාධු චණ්ඩාලකම්පි
නෙත්වා කාමං තිදිවමමරා සග්ගසම්පත්තිදනා,
ගච්ඡන්ති'ථො අකත සුකතා භූමිපාලාපි කාමං
ඝොරාපායං ජහථ භජථා'පුඤ්ඤපුඤ්ඤානි පඤ්ඤා'ති.

ලකුණු 20 යි

03. පහත සඳහන් ගද්‍ය ඡේදය පාලියට නගන්න.

තෙරුන් වහන්සේ ආහාර නොගන්නෝ පළමුවැනි දවසෙහි වත් පිළිවෙතින්ම දවස ගෙවීය. දෙවැනි දවසෙහි ද එසේම ගෙවී ගියේ ය. තුන් වැනි දින සැමළු බෝමළු හැමදීම ආදියෙන් කළයුතුදේ කොට විතර්ක මාලයෙහි සිටියේ ය. ඉක්බිති උන්වහන්සේගේ ගුණ තේජසින් මළුව කෙළවරෙහි සිටි කර ගසෙහි අධිගෘහිත දිව්‍ය පුත්‍ර තෙම සිරුර මැලවුණු තෙරුන් දැක තමන්ගේ බිරිය කැඳවා, මේ අභය හිමි සැයත් බෝධියත් අතහැර අන්තැනක නොයමි යි කරන ලද පිළිණ ඇත්තේ ය. මෙ වැනි දුක් බික් බියක් ඇති වූ කල කිසි තැනක නොගොස් බතින් තොරව වත් පිළිවෙත් කරයි. උන්වහන්සේට භික්ෂාවෙහි හැසිරෙන්නට තැනක් නොමැත. යම් විදියකින් උන්වහන්සේ කාලක්‍රියා කළොත් එය නුසුදුසු ය. අද මුන්වහන්සේට දානය දෙමුදැයි ඇසීය. ඉක්බිති සැමියාණෙනි, ඔබ තෙරුන් වහන්සේට ආහාර දෙමියි කියෙහි උන්වහන්සේ පෙර කරන ලද පින්කම් මට කියනු මැනවයි අසන්නියට මෙසේ කීයේ ය.

ලකුණු 20 යි

## II කොටස

04. සන්ධි කාර්යයෙහි ප්‍රයෝජන දක්වා ස්වර සන්ධිය උදාහරණ දක්වමින් පහදන්න.

05. ප්‍රභේද දක්වමින් බහුබ්බීහි සමාසය හඳුන්වන්න.

06. කාරක හඳුන්වා චතුර්ථි විභක්ති කාරක ප්‍රයෝග විස්තර කරන්න.

07. පාලියෙහි ආඛ්‍යාත භාවිතය හඳුන්වා "භවිස්සන්ති" ආඛ්‍යාතය උදාහරණ සහිතව පහදන්න.

(ලකුණු 20 බැගින්)

**************************************************